# 1. ශ්‍රී ලංකාවේ ආදිවාසීන් සම්භවය සහ ව්‍යාප්තිය

දීර්ඝ ඉතිහාසයක ට උරුමකම් කියන ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ ආරම්භය ව්‍යාප්තිය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම මෙම ලිපියේ ප්‍රධාන අරමුණයි මේ සඳහා ලිඛිත මූලාශ්‍ර සහ ආදිවාසීන්ගෙන් අසා දැනගත් තොරතුරු ඇතුලත්කර ඇත්තෙමි.

ආදිවාසීන් සඳහා ඉංග්‍රීසි භාෂාවේ යොදාගන්නා වචනය "Aborigin" යන්නය. මෙම වචනය ලතින් භාෂාවෙන් බිඳී ආ එකකි. ලතින් භාෂාවෙන් මුල් පදිංචිකරුවන් (From the begining) නැතිනම් උපතේ සිට පදිංචි වීම හැඳින්වීමට මෙය භාවිත කර තිබිණි. "Aborigin" යන්නට කේම්බ්‍රිජ් විශ්ව කෝෂය දෙන ලද අර්ථය වන්නේ බ්‍රිතාන්‍ය ජාතීන් යම් රටකට යෑමට පෙර එම රටේ ජීවත්වූ ජාතිය ලෙසයි. කෙසේ වෙතත් මෙය සාර්ථක අර්ථකථනයක් නොවුවද "Aborigin" යන්න රටක මුල් පදිංචිකරුවන් ලෙස හඳුනාගැනීමට පුළුවන. ඒ වගේම ලෝකයේ විවිධ රටවලට ආවේණික වූ ආදිවාසීන් ජීවත් වේ. නිදසුනක් ලෙස ඕස්ට්‍රේලියාවේ ඇබරෝජින්ස්, ඇමෙරිකාවේ රතු ඉන්දියානුවන්, නවසීලන්තයේ මෞර්යයන්, ආදිය දැක්විය හැකිය.

ශ්‍රී ලංකාවේ ආදිවාසීන් වැද්දා ලෙස හඳුන්වා ඇති අතර එයට තවත් අන්වර්ථ නාමද භාවිත කර තිබේ. පුලින්දයන්, සබර, වණසරණ, මිලක, මල්ලාවි, ව්‍යාධ, යනුවෙන් බොහෝ නම් භාවිත කරයි. ශ්‍රී ලංකාවේ වැද්දා යන භාවිතය සංස්කෘත භාෂාවෙන් බිඳී ආ එකකි. දුන්නෙන් විද සතුන් මරණ නිසා වැද්දන් යනුවෙන් හඳුන්වයි. පුලින්දයන් යන වචනය භාවිතවන්නේ කුවේණිගේ දරුවන් දෙදෙනා විවාහ වීම නිසා පහත් තත්ත්වයක් වූ නිසාම එය හැඳින්වීමට මෙය භාවිත කර ඇත. සබර යනුවෙන්ද වැද්දන් හඳුන්වා ඇත. වැදි සමූහය, සබර ගොමුව ලෙස සඳහන් වූ බව පොත්පත් වල සඳහන්ය.

ශ්‍රී ලංකාවේ වැදි ජනතාව කොටස් 3 කින් යුක්තවේ. ගල් වැද්දෝ, දඩ වැද්දෝ, ගම් වැද්දෝ වශයෙන් වන අතර සෙලිග්මාන්ගේ හඳුනාගැනීමේ ගල් වැද්දන් ගැන දක්වා නැත. එහිදී වැද්දන් ගම් වැද්දන් මුදුකර වැද්දන් යනුවෙන් වෙන්කර ඇත. ගල් වැද්දන් ලෙස හඳුන්වන්නේ බොහෝදුරට හමුවන සතකු විද මරණ නිර්වස්ත්‍රව සිටින වැදි ජනතාවය.

දඩ වැද්දන් දුනු හී රැගෙන දඩයමේ යන පුද්ගලයන්ය. මේ දෙවර්ගයම රාත්‍රී කාලයේදී දැකගත හැකිය. දහවල් කාලයට එළියට නොබසින මොවුන් දැකගත හැක්කේ රාත්‍රියේදී පමණි. ගම් වැද්දන් කැලෑ අද්දර හෝ දුර බැහැර ගම්වල විසූහ. කැළෑ තුළ ජීවත්වන මොවුන් දිළිඳු සිංහල සහ ද්‍රවිඩ ගම්බද ජනයා සමග වාසය කරයි.

මේ හඳුනාගැනීමට වෙනස්ම ආකාරයකට 1901 දී වැද්දන් පිළිබඳ ජන හා සංඛ්‍යා ලේඛනයේ සඳහන් කර තිබිණි. ගල් වැද්දන් සහ ගම් වැද්දන් යනුවෙන් කොටස් දෙකක් විය. නමුත් 1911 දී වැද්දා යනුවෙන් හැඳින්වූයේ ඔහු විසින්ම හඳුන්වා දියයුතු සාධක තුනක් පදනම් කරගෙනය. එනම් ඔහුගේ වර්ගය ආගම රැකියාව ලෙස දඩයම් කිරීම යන කරුණු සම්පූර්ණ කරන පුද්ගලයා වැද්දෙක් බව පිළිගත්හ. ඊට හේතු වූයේ මීට ප්‍රථම නිර්වචනයන් නිසාම මිනිසුන් වැද්දන් යයි කියා ගනිමින් ඉඩම් අයිතිකර ගැනීමට උත්සාහ දැරීමය. 1921 දී එම නිර්නායකම භාවිත කර ඇත. නමුදු 1946 දී යම් පුරුෂයෙකු හෝ ස්ත්‍රියක විසින් වැදදෙක් බව ප්‍රකාශ කළහොත් ඔහු වැද්දෙකු ලෙස හඳුන්වා ඇත. නමුත් පසු කාලයේදී ගන්නාලද මෙම නිර්වචන ආදිවාසීන් නීර්ණය කිරීමට එතරම් සුදුසු නොවීය. මානව විද්‍යාව දියුණු වීමත් සමග ඔහුගේ අංග ලක්ෂණ කෙරේ අවධානය යොමු කර ඇත. මානව විද්‍යාවේදී වැද්දනගේ ස්වභාවය දක්වනනේ ලජ්ජා හරිත නිහඬ පුද්ගලයෙකි. සිහින් සිරුරක් සහ කළු පැහැති දීප්තිමත් විවෘත ඇස් ඇත. කුඩා දිගටි හිසක් සහ පලල් මුහුණක් ඇත. නෙරාගිය හකුපාඩා හා සිහින් රැගලද අක්බඹරු හිස කෙස් ද දක්නට ඇත. මීට අමතරව නාසය අගවූ ස්වභාවය සහ ලේ වර්ගය පිළිබඳ අධ්‍යයනය කර ඔවුනගේ තොරතුරු සොයා ගැනීමක් වර්තමානයේ දැකිය හැකිය.

මේ ආකාරයට විවිධ නම්වලින් හා නොයෙකුත් නිර්වචනයන්ගෙන් හඳුන්වන ලද ආදිවාසීන්ගේ සම්භවය පිළිබඳ අවධානය යොමු කිරීමේදී විවිධ මත රාශියක් හඳුනාගත හැකිය. මේවා බොහොමයක් විශ්වාසය ඇදහිලි හා තොරතුරු මත පදනම් වී ඇත. පැරණිතම සඳහන වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයේ මෙරට තුළ ආදිවාසීන් ජීවත් වී ඇතිබවයි. බලංගොඩ මානවයා ආශ්‍රය කරගෙන මෙම කරුණු ඉදිරිපත් කරයි. ක්‍රි.පූ. 11000 සිට ක්‍රි.පූ. 500 දක්වා ජීවත් වූ බලංගොඩ මානවයා හා වැද්දන් අතර සම්බන්දය, ආචාර්ය ශිරාන් දැරණියගල මහතා පෙන්වා දී ඇත. වර්තමානයේ ජීවත්වන වැදි ජනතාව ඔවුන්ගේ පරිණාමයේ අවස්ථාවක් ලෙස දක්වා ඇත. ඒ වාගේම බුදුන් වහනසේ ලංකාවට වැඩම කරවීමේ කතා පුවත හා සම්බන්ධ ආදිවාසීන් කොටසක් වන යක්ෂ ගෝත්‍රිකයන්ද ඍජු ලෙසම බලංගොඩ මානවයාට අයත්

ජන කොටසක් බව ඔහු ප්‍රකාශ කරයි. කාබන් කාල නිර්ණය ඔස්සේ හෙළිවන බලංගොඩ මානවයාගේ අස්ථිමය අවශිෂ්ඨවල වයස සහ වංශකතාවල සඳහන් වන කාලය අතර සමාන බවක් තිබීම නිසාද මේ සාධක පිළිගත හැකි මට්ටමක තිබෙන බව ආචාර්ය දැරණියගල ප්‍රකාශ කරයි.


මේ සාධක සනාථ කිරිම සඳහා කුරුවිට බටදොඹ ලෙන, බටහොට ලෙන, රත්නපුර හංගමුවේ කැකුල ගල්ලෙන, කිතුල්ගල බෙලිලෙන, හා පස්දුන් කොරළයේ පාහියන් ලෙන ආදී පැරණිතම ස්ථානවල ආදිවාසින් සිටි බවට සාධක රාශියක් හමුවී ඇත.

මිට අමතරව වැද්දන්ගේ සම්භවය පිළිබඳ ජනප්‍රවාද රාශියක් දැකිය හැකිය. වැදගත්ම පුරාවෘතය වන්නේ කුවේණිගේ වැදි පරම්පරාවෙන් පැවත එනබව විශ්වාස කිරීමය. මහාවංශයේ හත්වන පරිච්ඡේදයේ දක්වන්නේ විජය කුමරු ඇතුළු පිරිස ලංකාවට පැමිණිමෙන් පසුව එවකට ලංකාවේ ජීවත් වූ යක්ෂ කාන්තාවක් වූ කුවේණිය සමග විවාහ වී පසුව රාජ්‍ය අභිෂේක ලැබීමේදී ඇය පන්නා දමීමෙන් පසුව විජයට දාව සිටි දරුවන්ද රැගෙන පළාගොස් ඇත. පසුව ලංකාපුර දී ඇයගේම නෑයන් අතින් මරණයට පත්වී ඇතිබවත් එතැනින් බේරී පළාගිය දරුවන් සමනොළ අඩවියේ සැඟවී සිට වියපත්වූ පසු අඹුසැමියන් ලෙස ජීවත් වීමෙන් ලද දරු පරම්පරාව පුලින්දයන් හෙවත් වැද්දන් ලෙස සම්භවය වූ බවත් මහාවංශයේ දක්වා ඇත. වැදි නායක වන්නිලැත්තන් ප්‍රකාශ කරන්නේද මේ ඉතිහාස විස්තරමය. වැදි ජනතාව පිළිබඳ ඇති අනෙක් මතය වන්නේ ආගන්තුක ජාතියක් ලෙස ආසියා මහද්වීපයෙන් මෙරට ට සංක්‍රමණය වූ ජනකොටසක් ලෙස උපකල්පනය කළ හැකිව ඇත. ඔස්ට්‍රේලියාවේද වැද්දන්ට සමාන ජන කොටසක් ජීවත්විය. ඔවුන් එරට ට සංක්‍රමණය වූ ජාතියකි. එය සිදුවන්නට ඇත්තේ දැනට වසර 15000 - 10000 අතර කාලයේදීය. එහිදී පෘථිවි ජල මට්ටම ඉහළ යෑමට පෙර ශ්‍රී ලංකාව ජාවා සුමාත්‍රා සෙලිබින් ආදී දිවයින් ආසියා මහද්වීපය හා එකට පවතින්නට ඇත. එහිදී මෙම ජන කොටස් ඔස්ට්‍රේලියාවට වගේම ලංකාවට ද සංක්‍රමණය වී ඇත යනුවෙන් ද මතයක් ගොඩනැගී ඇත.

## වැදි ජනතාවගේ ව්‍යාප්තිය.

මේ ආදී ලෙස වැද්දන්ගේ සම්භවය පිළිබඳ විවිධ මත රාශියක් ඉදිරිපත් වී ඇති බව මේ අනුව පෙන්වා දිය හැකිය. වැදි ජනතාව ගේ සම්භවයෙන් පසුව අපට ඔවුනගේ ව්‍යාප්තිය පිළිබඳ අවධානය යොමු කළ හැකිය.

වැදි ජනතාවගේ ව්‍යාප්තිය ගත්විට වියළි කලාපය පළමුවෙන් ම සිහියට නැගේ. නමුත් වැද්දන් වාසය කළ ස්ථාන තෙත් කලාපයේ ද ගම් රාශියක තිබුණු බව පළාතේ ග්‍රාම නාමවලින් හඳුනාගත හැකිය. වැද්දන්ගේ සම්භවය පිළිබඳව ඉදිරිපත් වී ඇති කරුණු අනුව මුල්ම ව්‍යාප්ත ප්‍රදේශ වන්නේ තෙත් කලාපයයි. බලංගොඩ මානවයාගේ තොරතුරු අනුව හෝ වංශකථාවල සඳහන් කරුණු අනුව .. තොරතුරු එක්රුස් වීමෙන් පෙන්නුම් කරණුයේ මූලික වශයෙන් වැදිජනතාව තෙත් කලාපයේ සබරගමු ප්‍රදේශයේ ජීවත් වී ඇති බවයි. සබරගමු පලාතේ රඹුක්කන, දෙවිගම්පොළ, සමනොළ අඩවියේ බටතොට හා බටදොඹ, කිතුල්ගල බෙලිලෙන, බෙල්ලන් බැඳි පැලැස්ස ආසන්නයේ කැරගල, රත්නපුර හංගමුවේ කැකුලගල්ලෙන, යන ප්‍රදේශවල ආදිවාසී වැදි ජනතාව ජීවත් වී ඇතිබවට විවිධ සාධක හමුවේ. වර්තමානයේ වැදි ජනතාව දක්නට නොමැති වුවත් අතීතයේදී ඔවුන් එහි වාසය කර ඇති බවට මානව විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක සාධක හමුවේ. (සිතියම බලන්න.)




මීට අමතරව වියලි කලාපයේ උතුරුමැද පළාතේ අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්කවල ද, ඌව පළාතේ බදුලු දිස්ත්‍රික්කයේද, නැගෙනහිර පළාතේ අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කයේ ද, උතුරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කයේ ද, උතුරුමැද පළාතට ආසන්නයේද වැදිජනතාවගේ නිජබිම් තිබූ බවට සොයාගත හැකිය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පමණක් වැදි ගම් 46 ක් තිබූ බව පර්යේෂණයක් මගින් හෙළි වී තිබේ. ඊට අමතරව වැද්දන් වාසය කර අත්හරින ලද ප්‍රදේශ 7 ක් තිබුණු බවත් හෙළි විය.

1911 දී කරන ලද අධ්‍යයනයක දී දකුණේ පානම් පත්තුවේ සහ නැගෙනහිර ඌවේ වැදි ගම්මාන ගැන ''ෆෙඩ්රික් ලිවිස්'' මහතා විස්තර කර ඇත. කුඹුක්කන් ඔය ඉහළ නිම්නය, පානම් පත්තුවේ හරි අඩක ප්‍රදේශයක වැදි ගම්මාන ඇතිබවත් මහවැදි රට, බුත්තල වැදි රට යනුවෙන් මේවා හඳුන්වා ඇත.

නැගෙනහිර පළාතේ මහඔය, නිල්ඔය, නුවරගල, සීතල වන්නිය, ඇඹිලින්න, උණුවතුර බුබුල, ඇත්බැන්දගල, හා පොල්ලෙබැද්ද යන ස්ථාන හඳුනාගත හැකිය. වෙරළ ආශ්‍රිතව කල්කුඩා, වාකරෙයි, යන ප්‍රදේශ වලදී වැදිජනතාව ජීවත් වී ඇත.

ඌව පලාතේ වැදි නිජබිම් ලෙස දඹාන වටවන, කන්දෙ ගම්වේල, කොටබකිනිය, කුකුලැව, සොරබොර ආදී ගම් දැකිය හැකිය. මුල්ලේගම, දානිගල, රහනෙ බැද්ද, දමනේගම, බිංගොඩ, යන ගම් ඌව පලාතේ වැදි නිජබිම්ය. මේවා මහියංගණය ට නැගෙනහිර දිශාවෙන් පිහිටා ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තන්තිරිමලේ, පුලියන්කුලම, ඇතාවැටුණුවැව, වන්නිහැල ඕදම, නවෝදානම, මහහැල ඕදම, ආදිය පැරණි වැදි ගම් කිහිපයකි.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගම් රාශියක වැදිජනතාව ජීවත්ව සිටඇත. දිඹුලාගල, මනම්පිටිය, සොරිවිල, ඇල්ලෙවැව, යක්කරේ, කරපොළ, මුතුගල, වැලිකන්ද, කඩවිත්මඩුව, දම්මින්න නිදන්වල, කන්දේගම, ගිරිදමන, දළුකාන, කුඩාවැව යනුවෙන් ගම්මාන රාශියක් ව්‍යාප්තව ඇත.

පලාත් කිහිපයක වැද්දන් ජීවත් වන බව මේ විස්තර අනුව පෙන්නුම් කලද වර්තමානයේ ඉතා සීමිත ප්‍රදේශ කිහිපයක වැද්දන් ජීවත්වන බව .... ඇති අතර මහියංගණය අසල පිහිටි ගම්මාන රැසක පමණක් වැද්දන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් ජීවත් වේ.

වැදි ජනතාව පිළිබඳ මේ දක්වා කෙරී ඇති ශාස්ත්‍රීය සංග්‍රහයන් බොහොමයක් ඇති අතර මෙතරම් ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමට හේතුව එය යම් රටක සංස්කෘතික අනන්‍යතාවය සහ පෞරාණික බව කියාපාන එක් සාධකයක් වන නිසාමය. මීට අමතරව එම රටේ සංචාරක කටයුතු දේශීය විදේශීය අයුරින් දියුණුකිරීමටත් එම පුරාවිද්‍යාත්මක සාධක සුරක්ෂණය

කිරීමටත් ය. විශාල ප්‍රදේශයක ජීවත්වූ මොවුන් සීමිත ප්‍රදේශයක දැන් ව්‍යාප්තව සිටීමත් සීමිත ජන සංඛ්‍යාවක් වන ඔවුන්ගේ අඩුවීම ශීඝ්‍රයෙන් පෙන්නුම් කරන යුගයක ඔවුන්ගේ අනන්‍යතාවය හා අවශ්‍ය පහසුකම් සපයා දී ජීවන තත්ත්වය උසස් කළ යුතුය.

**එම්.එම්. කමලි මාරසිංහ.**
**(භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය)**

මූලාශ්‍ර :

1) රුබේරු ටී. කේ. (2003)
රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය (පරිවර්තනයක්)
චතුර මුද්‍රණාලය

2) ස්පිට්ල් ආර්. එල්. (1999)
ලක්බිමේ තවත් යුගයක්,
සූරිය ප්‍රකාශකයෝ

3) විජේසේකර නන්දදේව (2003)
වැද්දන්ගේ විකාශන ක්‍රමය
සංස්කෘතික කටයුතු අමාත්‍යංශයේ ප්‍රකාශනයකි

4) ආචාර්ය රත්නපාල ඊ. එම්. (2003)
ලංකාවේ වැද්දෝ
ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල

5) මහාචාර්ය සෝමසුන්දර දයානන්ද (2006)
ශ්‍රී ලංකාවේ ආදිවාසීන්
චතුර මුද්‍රණාලය

6) මහවැලි වංශය (1 කාණ්ඩය), (1984)
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය කොළඹ

7) සබරගමුව වංශ කතාව (1 කාණ්ඩය 2003),
සබරගමුව පලාත් සභාව රත්නපුර

8) 2007.08.03-05 දක්වා කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ තොරතුරු.

## 2. දඹාන ආදිවාසීන්ගේ ජීවන හැඩතලයන්

ඌව පලාතේ මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි පිහිටා ඇති ''දඹාන ආදිවාසී ගම්මානය'' උතුරින් මාදුරු ඔය රක්ෂිතයෙන්ද, දකුණු දෙසින් රජයේ වන රක්ෂිතයෙන්ද, නැගෙනහිරින් මාදුරු ඔය උද්‍යානයෙන්ද, බටහිරින් පදියතලාව - මහියංගනය ප්‍රධාන මාර්ගයෙන්ද සීමාවී ඇත. ''දඹාන'' නිජබිම කරගත් ආදිවාසී ජනතාව ස්වකීය අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් ඔවුන්ගේ ජීවන රටාව ගෙනයති. මහා සම්ප්‍රදායට අයත් ජනවර්ගයන්ට සාපේක්ෂව ආදිවාසී ජනයාගේ ශාරීරික දේහ ලක්ෂණ, ජීවිකා වෘත්තීන්, සිරිත් විරිත්, භාෂාව හා ඇදහිලි විශ්වාස වෙනස් වන අතර දඹාන ආදිවාසී ජනතාව සතුව ඔවුන්ට ආවේණික වූ අර්ථක්‍රමයන්, වෙදහෙදකම් ජන ගී හා ශාන්ති කර්මයන් සුරක්ෂිතව පවතී.

### හේන් වගාව

ආදිවාසීන් තම පැවැත්මට භාවිතා කළ ආර්ථික ක්‍රමවේදය ඉතාමත් සරල වූවකි. ප්‍රධාන වශයෙන් ඔවුගේ පැවැත්මට යොදා ගැනුණ ක්‍රමයන් අතර හේන් ගොවිතැන හා දඩයම ප්‍රධාන වෙයි.

හේන් වගාවේදී ප්‍රදේශයක් ඔවුන් තෝරා ගත්තේ පරිසරයට හිතකාමී ලෙසයි. කලු බණ්ඩාර දෙවියන්ට පුද පූජා පවත්වා විශාල ගස් අවම සත්ත්වයන් බහුල නොවන ප්‍රදේශයක් ප්‍රථමයෙන් ඔවුන් නිර්ණය කර ගනියි. එහි එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා ගලක් විසිකර එම ගල වැටෙන ස්ථානය අදාළ කරගනිමින් භූමිය සීමා කර වගාව සිදු කරයි. වගා කටයුතු සඳහා යොදාගන්නා ප්‍රදේශය අක්කර දෙකක් හෝ තුනකින් යුක්තවේ. මායිම ලකුණු වන්නේ ගස් යොදා ගනිමින්ය. එක් හේනක් වගාවට යොදා ගත් පසු අනෙක් හේන හුවක් දුරින් පිහිටුවීමට ඔවුහු වග බලා ගනිති. මෙය ඔවුන්ගේ හදවත්වල තිබෙන සම්මතයකි. ඊට හේතුව ලෙස ඔවුන් දක්වන්නේ ඔවුන්ගේ ප්‍රධාන දඩයමට ඉඩකඩක් ලැබිය යුතු නිසාය. මේ පිළිබඳ විමර්ශනය කළ විට, ඔවුන් අනුගමනය කරන ක්‍රමය විද්‍යාත්මකය. අදවන විට පරිසර විද්‍යා ක්ෂෙත්‍රයේ පැහැදිලි කරන පරිසරයේ පැවතිය යුතු සමතුලිතා සංකල්පය එදා ආදිවාසීන්ගේ හදවත් තුළ ගැබ් ව ඇත. අද අපි ජීවත් වන තාක්ෂණික යුගයේ මිනිසුන් පවා මේ පිළිබඳ අඩු අවධානයක් යොමු කරයි.

එක් හේනක දිගින් දිගටම වගා කිරීමට වැදි ජනයා පුරුදු වී නොමැත. හේන් වගාව තැනින් තැනට ගොස් සිදු කිරීම නිසා සාමාන්‍යයෙන් එක් හේනක් වගා කරන්නේ අවුරුදු හතකට වරක් පමණි.